# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2133/63 – 2019 ජූලි 26 වැනි සිකුරාදා – 2019.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළේ සුළු කොට්ඨාසයේ, බදුල්ල නැගෙනහිර (78-බී) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කැඳලගම (කොට්ඨාස අංක 4 බදුල්ල මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක බී/බීඩීඑල්/2016/381 හා 2016.12.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් දක්වෙන ඉඩම් කැබලිවලට මායිම්:

**01. කැබලි අක්ෂර 'ඒ' – කොස්කණුව – ප්‍රමාණය: හෙක්. 0.7851ක් පමණ**

උතුරට: සිමෙන්ති කාණුව, මුතියංගන රජ මහා විහාරය හිමිකම් කියන පස්නවෙල සහ ජී. අබේකෝන් හිමිකම් කියන මහකිරිපොත; නැගෙනහිරට: ජී. අබේකෝන් හිමිකම් කියන මහකිරිපොත, එස්. කුමාර, එල්. එච්. ප්‍රේමසිරි, ඩබ්. කරුණාරත්න, පී. සිංහරාජා හිමිකම් කියන හිරිකුඹුර; දකුණට: එස්. කුමාර, එල්. එච්. ප්‍රේමසිරි, ඩබ්. කරුණාරත්න, පී. සිංහරාජා, ඩී. එම්. සුමතිපාල, එල්. එච්. අමරපාල, ටී. පොන්නුසාමි, එස්. ප්‍රේමරත්න, ඩබ්. පී. මනිමේල්, එස්. බණ්ඩාර හිමිකම් කියන හිරිකුඹුර, නලින් අබේසිංහ හිමිකම් කියන කොස්කණුවේවත්ත, කැබලි අක්ෂර සී සහ බී; බටහිරට: ඩී. එම්. සුමතිපාල, එල්. එච්. අමරපාල, ටී. පොන්නුසාමි, එස්. ප්‍රේමරත්න, ඩබ්. පී. මනිමේල්, එස්. බණ්ඩාර හිමිකම් කියන හිරිකුඹුර, නලින් අබේසිංහ හිමිකම් කියන කොස්කණුවේවත්ත, කැබලි අක්ෂර සී සහ බී, සිමෙන්ති කාණුව සහ මුතියංගන රජ මහා විහාරය හිමිකම් කියන පස්නවෙල.

**02. කැබලි අක්ෂර 'බී' – කොස්කණුව – ප්‍රමාණය: හෙක්. 0.1318ක් පමණ**

උතුරට: සිමෙන්ති කාණුව සහ කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ සහ සී; දකුණට: කැබලි අක්ෂර ඒ , සී, නලින් අබේසිංහ සහ විද්‍යාරත්න පිරිවෙන හිමිකම් කියන කොස්කණුවේවත්ත ; බටහිරට: නලින්

අබේසිංහ, විද්‍යාරත්න පිරිවෙන හිමිකම් කියන කොස්කණුවේවත්ත සහ සිමෙන්ති කාණුව.

03. **කැබලි අක්ෂර 'සී' – කොස්කණුව – ප්‍රමාණය: හෙක්. 0.0289ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර බී සහ ඒ; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ; දකුණට: කැබලි අක්ෂර ඒ , එස්. බණ්ඩාර හිමිකම් කියන හිරිකුඹුර සහ නලින් අබේසිංහ හිමිකම් කියන කොස්කණුවේවත්ත; බටහිරට: නලින් අබේසිංහ හිමිකම් කියන කොස්කණුවේවත්ත සහ කැබලි අක්ෂර ඒ.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2016/ඊ/366.
2019 ජනවාරි මස 03 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 – 434

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.